# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2340/59 – 2023 ජූලි 15 වැනි සෙනසුරාදා – 2023.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1999 නොවැම්බර් මස 15 වැනි දින අංක 1106/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1999 අංක 235 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/96/NH/741.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DST/LND/I/ACQ/16.
2023 ජුනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, වගේගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන අ. ග. පි. 290, අතිරේක අංක 29, පත්‍ර අංක 22 සහ 2013. 05. 08 දිනැති අවසාන ගමේ පිඹුරේ සවිස්තරව පෙන්නුම්කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 817 – රන්කොත්මළු විහාරය හෙවත් කිරිමදු පංගුව, මිනීපිට්ටනියෙමුලන, සියඹලාගහමුලන, එරබදුගහවත්ත, මල්වත්ත – ප්‍රමාණය: හෙක්. 1.1471**

උතුරට: කැබලි අංක 250 සහ $268^{B}$; නැගෙනහිරට: කැබලි අංක 250 සහ $268^{B}$; දකුණට: කැබලි අංක 818; බටහිරට: කැබලි අංක 818, 250 සහ $268^{B}$

EOG 07- 0122